## I වන පරිච්ඡේදය

## විශ්වවිද්‍යාල පද්ධතිය සහ එහි පරිපාලන ව්‍යුහය

1. මූලික නීතිමය ප්‍රතිපාදන
2. විශ්වවිද්‍යාල පද්ධතිය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. ඇමතිවරයා සතු බලතල
5. උසස් අධ්‍යාපන ආයතන
6. වෙනත් සාමාන්‍ය ප්‍රතිපාදන

## I වන පරිච්ඡේදය

## විශ්වවිද්‍යාල පද්ධතිය සහ එහි පරිපාලන ව්‍යුහය

1. **මූලික නීතිමය ප්‍රතිපාදන**

1.1 විශ්වවිද්‍යාල පවත්වාගෙන යාම සඳහා වූ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන මින් මතුවට, මෙම ආයතන සංග්‍රහය තුල "පනත" යන නාමයෙන් හඳුන්වනු ලබන, 1979 ජනවාරි පළමු වැනි දින බලාත්මක වූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ පහතින් සඳහන් සංශෝධනයන් මඟින් ලබා දී තිබේ. නියාමන පද්ධතිය

(අ) 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ආ) 1988 අංක 24 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ඇ) 1988 අංක 26 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ඈ) 1988 අංක 33 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ඉ) 1989 අංක 03 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ඊ) 1995 අංක 01 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(උ) 2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත
(ඌ) 2016 අංක 17 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත

1.2 මින් ඉදිරියට "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ප්‍රකාශිත මෙම ආයතන සංග්‍රහයෙහි අඩංගු කිසියම් ප්‍රතිපාදනයක් හෝ එම කොමිෂන් සභාව මඟින් වරින් වර ප්‍රකාශයට පත් කරනු ලබන්නා වූ චක්‍රලේඛ උපදෙස් තුල පිහිටා ක්‍රියාත්මක විය යුතු අතර, එකී ප්‍රතිපාදනයන්හි අධිකාරිය තුල පිහිටා ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

1.3 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ අනතුරුව එකී පනතට හඳුන්වා දෙන ලද සංශෝධන විශ්වවිද්‍යාල පද්ධතිය පාලනය සඳහා වූ මූලික සහ ප්‍රධාන නීතිමය ප්‍රතිපාදනයන් ඇතුලත් නීතිමය සාධන පත්‍රයක් වුව ද, පහත සඳහන් ව්‍යවස්ථාපිත ලේඛන ද එකී ඉහත සඳහන් ප්‍රතිපාදනයන් තුල අඩංගු වන්නේ ය.

- 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව සහ පසුව හඳුන්වා දුන් සංශෝධන
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කරන ලද්දා වූ නීති
- 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවකයින් සඳහා වූ පනත
- 1971අංක 38 දරන මුදල් පනත
- 1993 අංක 19 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂිත දීමනා පනත
- 1957 අංක 49 දරන රාජ්‍ය ව්‍යවසාය සහ සංස්ථා පනත
- 1998 අංක 20 දරන පනතින් සම්මත කරන ලද කුමන ආකාරයේ නවකවද සිද්ධීන් හෝ වෙනත් හිංසන උසස් අධ්‍යාපන ආයතන තුල තහනම් කරමින් පනවන ලද නීති

සහ

- වෙනත් අදාල පනත් සහ විධිවිධාන

1.4 අතිරේක නීති

පනතෙහි අඩංගු ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරිම පහසුවනු පිණිස පුළුල් පරාසයක් ආවරණය වන පරිදි අතිරේක නීති මාලාවන් සම්පාදනය කිරීමට අවශ්‍ය සාධන පත්‍ර සකස් කිරීම වෙනුවෙන් ද ප්‍රතිපාදන සකස් කොට ඇත. "උචිත සාධන පත්‍ර"යන්නට පනතෙහි විධි විධානයන්ට අනුකූලවන විධාන, ව්‍යවස්ථා, අතුරු ව්‍යවස්ථා, රෙගුලාසි සහ රීති ඇතුලත් වේ. උචිත සාධන පත්‍ර

විධාන

1.4.1 තමා හට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පවරා දී ඇති බලතල ප්‍රකාරව විශ්වවිද්‍යාල අධ්‍යාපනය භාර අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව අදාල පරිදි විධාන (නියෝග) නිකුත් කරනු ලැබේ. විධාන

පහත සඳහන් උසස් අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරිමේ දී එනම්, විශ්වවිද්‍යාල පනතෙහි 21 වන කොටස, මණ්ඩප පනතෙහි 22 වන කොටස, විවෘත විශ්වවිද්‍යාල පනතෙහි 23 වන කොටස, විශ්වවිද්‍යාල විද්‍යායතන පනතෙහි 24 වන කොටස, ආයතන හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන සහ උපාධි පිරිනැමීමේ ආයතන පනතෙහි 25 (අ) වන කොටස ස්ථාපිත කිරීම සඳහා

1.4.2 තමන් හට පනත මඟින් පැවරී ඇති සියළුම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන නියමාවලී සම්පාදනය කිරීමේ බලය පනතෙහි 18 වන කොටස මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පවරා දී ඇත. නියමාවලිය

උදා :

2020 අංක 05 දරන උපාධි පීඨ නියමාවලිය, 1979 අංක 05 දරන සිසුන් ඇතුලත් කර ගැනීමේ නියමාවලිය, 1995 අංක 04 දරන නියෝජ්‍ය උපකුලපතිවරයකු පත් කර ගැනීම පිළිබඳ නියමාවලිය, 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලිය, 2015 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල් නියමාවලිය සහ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යාපන ජාතික මධ්‍යස්ථානය පිහිටුවමින් සකස් කරන ලද නියමාවලිය මෙවැනි උදහරණ කිහිපයකි.

පනතේ අංක 88 වන වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලය හට ද, තමන් හට පවරා ඇති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හැගෙන නියමාවලි සම්පාදනය කිරීමේ හැකියාව පවතී.

1.4.3 විශ්වවිද්‍යාල පනතෙහි ප්‍රතිපාදන යටතේ පනවන ලද යම් විධානයක හෝ ව්‍යවස්ථාවක ප්‍රතිපාදනයන්ට යටත් ව, එම පනතේ 135 වන වගන්තිය මඟින් දක්වා ඇති කරුණු එකක් හෝ කිහිපයක් විෂයයෙහි අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීමේ බලය ඒ ඒ උසස් අධ්‍යාපන අයතනයන්හි පාලක බල මණ්ඩලය වෙත පැවරී ඇත්තේ ය. එසේ සම්පාදනය කරනු ලබන්නා වූ අතුරු ව්‍යවස්ථාවන් එහි සඳහන් දිනයේ සිට බලාත්මක වනු ඇත. උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කටයුතු හෝ විභාග කටයුතු සම්බන්ධ කුමන හෝ කරුණක් අරබයා සම්පාදනය කරනු ලබන අතුරු ව්‍යවස්ථා, අදාල පරිදි සනාථන සභාව හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් පිළියෙල කොට පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

1.4.4 රෙගුලාසි: විශ්වවිද්‍යාල පනතෙහි අඩංගු ප්‍රතිපාදනයන්ට අනුකූලව නිකුත් කරනු ලැබූ යම් විධානයක්, නියමාවලියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් යටතේ යම් අධ්‍යයන කරුණක් සංශෝධනය කිරීම, විචලනය කිරීම හෝ අවලංගු කිරීම විෂයයෙහි උසස් අධ්‍යාපන ආයතනයක සනාථන සභාව හෝ ශාස්ත්‍රීය කමිටුව මඟින් රෙගුලාසි සම්පාදනය කරනු ලැබිය හැකි ය. රෙගුලාසි

1.4.5 රීති: විශ්වවිද්‍යාල පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයක ප්‍රතිපාදනයන්ට යටත් ව, කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය, නියමිත බලධරයකු, වෙනත් බලධරයකු හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් සමුච්ඡයක් විසින් පහත සඳහන් කරුණු විෂයයෙහි රීති සම්පාදනය කළ හැකි වේ. රීති

(අ) විශ්වවිද්‍යාල පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයක ප්‍රතිපාදනයන්ට යටත්ව, රීතීන් සම්පාදන කිරීම අවශ්‍ය යැයි සැලකෙන කරුණු.

(ආ) විශ්වවිද්‍යාල පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයක ප්‍රතිපාදනයන්ට යටත්ව, රීතීන් සම්පාදන කිරීමේ අවශ්‍යතාව සහ බලය ලබා දීම.

(ඇ) විශ්වවිද්‍යාල පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් ප්‍රතිපාදනය නොකළ ද, කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය, විශේෂිත බලධරයකු, වෙනත් බලධරයකු හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් සමුච්ඡයකට අදාළ අනෙකුත් සියලුම කරුණු.

## 2. විශ්වවිද්‍යාල පද්ධතිය

2.1 විශ්වවිද්‍යාල පද්ධතිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ සියළුම විශ්වවිද්‍යාල (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුලත් ව), මණ්ඩප, විශ්වවිද්‍යාල විද්‍යායතන, ආයතන සහ උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන යනාදියෙන් සමන්විත වේ. මෙම සියළුම ආයතන "උසස් අධ්‍යාපන ආයතන" වශයෙන් හැඳින්වේ.

2.2 විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රමුඛස්ථානය මධ්‍යම ආණ්ඩුව නියෝජනය කරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපන භාරව කටයුතු කරන අමාත්‍යවරයා විසින් දරනු ඇත. පනතෙහි 19 වන වගන්තිය ප්‍රකාර ව, අමාත්‍යවරයා විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කටයුතු සහ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් මඟපෙන්වීම පිළිබඳ වගකීම දරනු ලබයි.

2.3 උසස් අධ්‍යාපන ආයතනයන් පිහිටුවීම කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයක් මාර්ගයෙන් සිදු වේ. ඒ ඒ විශ්වවිද්‍යාල (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ද ඇතුලත්ව), මණ්ඩප, විශ්වවිද්‍යාල විද්‍යායතන, ආදිය ට ඇතුලත් විය යුතු පීඨ සහ අධ්‍යයන දෙපාර්තමේන්තු එකී නියෝග ඇතුලත් වනු ඇත. ආයතන හා උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන විෂයයෙහි එකී කරුණු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සම්පාදනය කරනු ලබන නියමාවලියක් මඟින් නියම කරනු ඇත. — විෂයභාර අමාත්‍යවරයා උසස් අධ්‍යාපන ආයතනයන් පිහිටුවීම

2.4 ඉහත සඳහන් පරිදි අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝග සහ කොමිෂන් සභාව විසින් සම්පාදනය කරනු ලබන නියමාවලි සියල්ලම රජයේ ගැසට් පත්‍රයේ පලකල යුතු අතර, එකී නිවේදනයන්හි නියම කරනු ලබන දිනය, අදාල නියෝග සහ නියමාවලි ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකේ. — රජයේ ගැසට් පත්‍රයේ පලකළ යුතු වේ

2.5 ව්‍යවස්ථාපිත මණ්ඩල වශයෙන් 1978 අංක 16 දරන පනත සහ එහි සංශෝධන යටතේ ස්ථාපිත කොට ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනයන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ අංක 170 දරන වගන්තිය යටතේ රාජ්‍ය සංස්ථා ලෙස ගැනෙනු ඇත. — රජයේ සංස්ථා

## 3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

3.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිත්‍ය ක්‍රියාවලියක් සහ තමන්ට අනන්‍ය වූ කුල ලාංඡනයක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සැලකෙන අතර, විශ්වවිද්‍යාල පද්ධතිය මෙහෙයවීමේ බලතල ද කොමිෂන් සභාව සතු වේ. පනතේ 2 (2) වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්ති සහ මඟපෙන්වීම් ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලතල ද, උසස් අධ්‍යාපන ආයතන සහ රජය අතර සිදුවන ගනුදෙනු වල දී අතරමැදියෙකු සේ ක්‍රියාකිරීම ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරනු ලබයි. — සංස්ථාවක් වන බව

3.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් පස් අවුරුදු කාලයක් සඳහා පත් කරනු ලබන සභාපතිවරයෙක්, උප සභාපතිවරයෙක් සහ තවත් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමන්විත වන්නේ ය. — සමාජිකත්වය

3.3 කොමිෂන් සභාවේ විෂය පථය වනුයේ; — විෂය පථය

අ) ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

ආ) පාර්ලිමේන්තුව මඟින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් අනුමත කරනු ලැබූ අරමුදල් ඒ ඒ උසස්

අධ්‍යාපන ආයතනයන් වෙත අදාල පරිදි බෙදා වෙන් කොට දීම සහ වියදම් කිරීම පාලනය කිරීම.

ඇ) උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන නිර්ණායකයන් පවත්වාගෙන යාම.

ඈ) උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනමය කටයුතු නියාමනය කිරීම.

ඉ) උසස් අධ්‍යාපන ආයතනයන් වෙත සිසුන් ඇතුලත් කර ගැනීම නියාමනය කිරීම.

ඊ) පනත මඟින් හෝ එහි ප්‍රතිපාදන යටතේ හෝ කොමිෂන් සභාවට පවරා ඇති හෝ බලාත්මක කරනු ලැබ ඇති සියළුම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ විසර්ජනය කිරීම.

3.4 කොමිෂන් සභාවේ බලතල

3.4.1 පනතේ 15 වන වගන්තිය සහ අදාල සංශෝධනයන්ට අනුව කොමිෂන් සභාව සතු බලතල විග්‍රහ කොට තිබේ. එකී 15 වන වගන්තිය සහ 71(2), 144 වගන්ති වලින් විශේෂිතවම පවරා ඇති බලතලවලට අමතරව කොමිෂන් සභාව වෙත අනුමිතියෙන් පැවරෙන වෙනත් බලතල කිහිපයක් ද ඇත්තේ ය.

උදා : පනතේ 18 වන වගන්තියේ (V) වන ඡේදය, පනතෙහි 45(2) වගන්තියේ (XV) සහ (XVII) ඡේදයන්, පනතෙහි 50 වන වගන්තිය, පනතෙහි 45(2) සහ 67 යන වගන්ති සමඟ කියවනු ලබන 63(3) වගන්තිය.

3.4.2 පනතෙහි 29, 45, 15 සහ 45(2) වගන්ති සමඟ කියවනු ලබන 63(3) වගන්ති වලට අනුව එක් එක් උසස් අධ්‍යාපන ආයතනයන්හි සහ එකී පාලක සභාවන් සතු බලතල, කොමිෂන් සභාවේ මැදිහත් වී ක්‍රියාකිරීමේ බලතල, කාර්යය සහ කර්ත්‍යවයන්ට යටත් වේ.

කොමිෂන් සභාවේ මැදිහත් වී ක්‍රියා කිරීමේ බලය

එක් එක් ආයතනයක් හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාල නියමාවලියන්හි අදාල ඡේදයන්ට අනුව ද ඉහතින් සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාව විසින් කළ හැකි ය.

උසස් අධ්‍යාපන ආයතනයක පාලක සභාව විසින් ගනු ලබන තීරණයන් කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යයන්ට ඍජුවම හෝ ආනුෂාංගික වශයෙන් බලපානු ලබන්නේ නම්, එම තීරණය සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය හෝ එකඟත්වය ලබා නො ගත්තේ නම්, එකී තීරණය සඳහා නෛතික පිළිගැනීමක් නොමැති සේ සැලකෙන අතර, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන් ද වැළකිය සිටිය යුතු ය. එවැනි තීරණ, අවසාන තීරණ සේ නො සැලකෙන අතර, ඒවා තම නිර්දේශ ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| 3.4.3 | යම් තීරණයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය හෝ එකඟත්වය ලබා ගැනීම අවශ්‍ය යැයි නියම කරනු ලැබ තිබේ නම්, එකී තීරණය කොමිෂන් සභාව වෙත යොමු කිරීම, අදාල උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා සතු වගකීමක් වන්නේ ය. එවැනි අවස්ථාවක දී, විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක නිලධාරියා හෝ ලේකම්වරයා/ ලේඛකාධිකාරීවරයා, විශ්වවිද්‍යාල විද්‍යායතනයක, මණ්ඩපය, ආයතනයක හෝ උසස් අධ්‍යයන මණ්ඩලයක බලයලත් ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියකු විසින් අදාල කාර්ය සටහන් (minute) සහ එහි උද්ධෘතය ද සවිස්තරාත්මක මෙමෝ පත්‍රයක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.<br><br>එකී මෙමෝ පත්‍රිකාවෙහි, අදාල තිරණ ගැනිමට හේතු පාදක වු කරුණු සහ එම නිර්දේශය ඉදිරිපත් කිරිමට හේතු ද සවිස්තරාත්මකව දැක්විය යුතු වේ. | ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකිම |
| 3.5 | කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන ආයතනයක් වෙත නිකුත් කරනු ලබන පරිපාලන මඟපෙන්වීම | උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම |
| 3.5.1 | කොමිෂන් සභාව විසින් වරින් වර, උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනමය කටයුතු විධිමත් කිරීමේ අදහසින් සහ එම අරමුණු, බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ප්‍රකාර ක්‍රියාත්මක වීමටත්, කොමිෂන් සභා ලේකම් කාර්යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලවල මාර්ගෝපදේශය ඊට අනුකූලව ක්‍රියා කිරීම සඳහාත්, පරිපාලන හා මුදල් රෙගුලාසි, සංග්‍රහ, චක්‍රලේඛ සහ චක්‍රලේඛ ලිපි ද කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි ය. | |
| 3.5.2 | පනතෙහි 137 වගන්තිය සහ මෙහි 3.5.1 උපඡේදයේ සඳහන් පරිදි කොමිෂන් සභාව විසින් පිළියෙල කරනු ලැබූ පරිපාලන මඟපෙන්වීම් සහ රිති ඇතුලත්, මෙම ලේඛනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වු ආයතන සංග්‍රහය යනුවෙන් හඳුන්වනු ලැබේ. | පනතෙහි 137 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති රීතියකි. |
| 3.5.3 | රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් පිළිපැදීම සඳහා නිකුත් කරනු ලැබූ යම් චක්‍රලේඛයක් හෝ චක්‍රලේඛ ලිපියක් මඟින් දෙනු ලබන උපදෙස් කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක අභ්‍යන්තර කරුණු කෙරෙහි බලපාන අවස්ථාවල දී, විශ්වවිද්‍යාල පනතේ විධිවිධානයන්ට එකී චක්‍රලේඛ උපදෙස් අභිබවා ක්‍රියාකිරීමේ බලය ඇත.<br><br>කෙසේ වුවද, එකී උපදෙස් පනතෙහි විධිවිධාන හා සමපාත වන අවස්ථාවල දී, එකී උපදෙස් පිළිගැනීමට සහ ඒ අනුව ක්‍රියාකිරීමට කොමිෂන් සභාවට තීරණය කළ හැක. | වෙනත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේනතු මඟින් නිකුත් කරන චක්‍රලේඛ |

ඉහත සඳහන් චක්‍රලේඛයන්හි අඩංගු උපදෙස් පිළිගැනීම මැනැවැයි කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවන්හි දී, එකී උපදෙස් පිළිපැදීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයන් වෙත දන්වා යැවීම කොමිෂන් සභාව විසින් සිදු කෙරේ.

## 4. අමාත්‍යවරයා සතු බලතල

පනතෙහි 20 වන වගන්තිය සහ එයට අදාල සංශෝධන ප්‍රකාර අමාත්‍යවරයා විසින්;

4.1 මුදල්, විශ්වවිද්‍යාලයක ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඉගැන්වීමේ මාධ්‍යයන් යන කරුණුවලට අදාල ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා වූ පොදු ලිඛිත විධානයන් අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත නිකුත් කරනු ලබන අතර, එම විධාන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු වේ. — ලිඛිත විධානයන්

4.2 උසස් අධ්‍යාපන ආයතනයක පරිපාලනමය හෝ වෙනත් ඕනෑම කරුණක් විභාග කොට වාර්තා කිරීමට සහ එවැනි අවස්ථාවන් වලදී අමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද කොමිෂන් සභාවට විධාන කළ හැකි ය. — විමර්ශනය කළ යුතු කරුණු

4.3 උසස් අධ්‍යාපන ආයතනයක පැන නැගී ඇති යම් අර්බුදකාරී තත්ත්වයක් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වේ යැයි සිතන අවස්ථාවක දී හෝ එම තත්ත්වයන් රජයේ ප්‍රතිපත්තීන් වෙත තීරණාත්මක හෝ අගතිගාමී ලෙස බලපානු ලබන්නේ නම්, හෝ අදාල ආයතනයන්ගේ පැවැත්මට හානිකර යැයි සැලකෙන අවස්ථාවන්හි දී හෝ එකී තත්වයන් පාලනය කිරීම උදෙසා ගත හැකි සියළු පියවර ගැනීමට කොමිෂන් සභාව වෙත උපදෙස් දිය හැකි ය. — අර්බුදකාරී තත්ත්වයක් පාලනය කිරීම

4.4 වර්ජන ක්‍රියාමාර්ග හේතුවෙන් යම් උසස් අධ්‍යාපන ආයතනයක පරිපාලනය තදබල ලෙස බිඳවැටී ඇති අවස්ථාවක දී හෝ ආයතනයට ඇතුළුවීම අවහිර කොට ඇති අවස්ථාවක දී හෝ එකී ආයතනයේ පරිපාලනය විසින් එම තත්ත්වයන් පාලනය කිරීමට අපොහොසත් වූ අවස්ථාවක දී හෝ වෙනත් එවැනි අවස්ථාවක දී, එම තත්ත්වයන් යථාවත් කිරීම පිණිස අමාත්‍යවරයා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග වලින් එකක් හෝ සියල්ලම ගත හැකි වන්නේ ය. — සාමාන්‍ය පරිසරයක් ප්‍රතිශ්ඨාපනය කිරීමේ වගකීම

(අ) එම උසස් අධ්‍යාපන ආයතනය වසා දැමීම.

(ආ) පනත මඟින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් පවරා ඇති බලතල සහ කාර්යය ප්‍රකාරව, උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු, බලධරයකු හෝ වෙනත් මණ්ඩලයක් වෙනුවට එකී බලතල ක්‍රියාත්මක කිරීමට, පිළිපැදීමට සහ නිෂ්කාශනය කිරීම සඳහා නමින් හෝ ඔහු/ඇය දරන්නා වූ තනතුර මඟින් පත් කිරීමට

(ඇ) ඉහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් අදාළ වූ යම් කාර්යයක් විෂයයෙහි ක්‍රියාමාර්ග ගැනීමට

## 5. උසස් අධ්‍යාපන ආයතන

5.1 "උසස් අධ්‍යාපන ආයතනයන්" යන්න යටතට පනතෙහි 147 වගන්තිය ප්‍රකාරව සහ එහි 21, 22, 23, 24 හා 24A වගන්ති යටතේ පිහිටුවා ඇති සහ පිහිටුවීමට නියමිත විශ්වවිද්‍යාල, මණ්ඩප, විවෘත විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන හෝ වෙනයම් උසස් අධ්‍යාපන ආයතනයන් අයත් වේ.

උසස් අධ්‍යාපන ආයතනයන්

5.2 "උසස් අධ්‍යාපන ආයතනය" යන්නට සහ 2016 අංක 17 දරන (සංශෝධිත) පනතේ සහ 147 වන වගන්තිය ප්‍රකාරව 24A හෝ 24B වගන්ති යටතේ, උසස් අධ්‍යාපනය ලබාදීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද හෝ පිහිටුවීමට නියමිත ආයතනයන් අයත් වේ.

උසස් අධ්‍යාපන ආයතනය

5.3 සෑම විශ්වවිද්‍යාලයක්, විවෘත විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක්ම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත ව, එක් එක් විෂයයන්ට අදාලව උසස් අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීමේ, වර්ධනය කිරීමේ සහ ඉදිරියට ගෙනයාමේ අරමුණ ඇතිව ඒ ඒ විධානයන් මඟින් පිහිටුවන ලද ආයතන වේ. [පනතෙහි 21(අ), 23 (අ) සහ 24 (අ)] විශ්වවිද්‍යාලයකට අනුබද්ධ නො වූවද, පනතෙහි 24 (අ) වගන්තිය යටතේ සහ අදාල නියමාවලියන් හි සඳහන් පරිදි පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයන් ද අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවන් ලෙස ගැනේ.

විශ්වවිද්‍යාලය

5.4 මණ්ඩපයක් විශ්වවිද්‍යාලයකට අනුබද්ධිතව, එම මණ්ඩපය පිහිටුවීමට අදාල නියමයක් මඟින් ස්ථාපිත කොට තිබේ [පනතෙහි 24 (f) වගන්තිය].

මණ්ඩප

5.5 විශ්වවිද්‍යාල විද්‍යායතනයක්, විශ්වවිද්‍යාල එකක් හෝ කිහිපයකට අනුයුක්තව, එකී විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවීමට අදාල විශ්වවිද්‍යාල විද්‍යායතන නියමයන් මඟින් ස්ථාපිත කොට තිබේ. [පනතෙහි 24 (f) වගන්තිය]

විශ්වවිද්‍යාල විද්‍යායතන

5.6 උසස් අධ්‍යාපන ආයතනයක සාමාන්‍ය පරිපාලන බලතල, කාර්යය සහ කර්තව්‍යයන්;

5.6.1 විශ්වවිද්‍යාලයක සාමාන්‍ය පරිපාලන බලතල, කාර්යය සහ කර්තව්‍යයන් පනතෙහි 28 හා 29 යන වගන්ති සහ අදාල සංශෝධනයන් හි නිර්ණය කොට තිබේ. විශ්වවිද්‍යාලයක් විෂයයෙහි පවරා ඇති බලතල, කොමිෂන් සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍යයන් යටතට ගැනේ යැයි, පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයකින් දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, එකී විශ්වවිද්‍යාලයේ පාලක සභාව මඟින් ක්‍රියාත්මක කරනු ඇත. [පනතෙහි 28(2) වගන්තිය ]

විශ්වවිද්‍යාලයක බලතල, කාර්යය සහ කර්තව්‍යයන්

5.6.2 විශ්වවිද්‍යාල විද්‍යායතනයක් සතු පරිපාලනමය බලතල, කාර්යය සහ කර්තව්‍යයන්, පනතෙහි 54 සහ 55 වගන්ති (අදාල සංශෝධන ද සමඟ) මඟින් නිර්ණය කොට තිබේ. විශ්වවිද්‍යාල විද්‍යායතනයක් වෙත පවරා දී ඇති බලතල, අදාල විශ්වවිද්‍යාල

විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක බලතල/කාර්යයන්

විද්‍යායතන නියෝගයන්හි දක්වා ඇති පරිදි සහ කොමිෂන් සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍යයන් හට යටත්ව, එකී විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ඇත.

5.6.3 විශ්වවිද්‍යාලයක මණ්ඩපයක්, පාලනය කිරීම එකී විශ්වවිද්‍යාලය මඟින් පනවා ඇති ලිඛිත ව්‍යවස්ථා මඟින් නියම කොට ඇති සාමාන්‍ය සහ වෙනත් පරිපාලන බලතල අනුව මණ්ඩප සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. මණ්ඩප සභාවට එකී මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනයට අවශ්‍ය හෝ අදාල වන්නාවූ රීති, විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතියට යටත් ව සම්පාදනය කළ හැකි වේ.

මණ්ඩපය සතු පරිපාලනමය බලතල

5.6.4 ආයතනයක/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක බලතල සහ කාර්යයන්, පනතෙහි වෙනත් උචිත සාධන පත්‍රයක විධිවිධානයන්ට හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කර්යයන් සහ කර්තව්‍යයන්ට යටත්ව, එකී ආයතනය පිහිටුවීමට අදාල නියමාවලියෙ හි දක්වා ඇති පරිදි වේ.

ආයතනයක/උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක සතු බලතල සහ කාර්යයන්

5.7 උසස් අධ්‍යාපන ආයතනයන්හි බලධරයින් සතු බලතල

5.7.1 පනතෙහි 44 (1) වගන්තියෙ හි දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලයක පාලක සභාව, විශ්වවිද්‍යාලයේ විධායක සභාව සහ පාලක බල මණ්ඩලය ද වේ. එම වගන්තියෙහි ම පාලක සභාවේ සංයුතිය ද නිශ්චය කොට ඇති අතර, පනතෙහි 45(1) වගන්තියට අනුව එකී පාලක සභාවට පවරා දී ඇති බලතලයන් හි ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, පනතෙහි 45(2) හා සංශෝධිත වගන්තිවල සඳහන් බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ මුදාහැරීම කළ හැකි ය.
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විෂයයෙහි, ඉහත සඳහන් සියළු කරුණු 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ දක්වා තිබේ.

පාලක සභාවේ බලතල කාර්යය සහ කර්තව්‍යයන්

5.7.2 විශ්වවිද්‍යාලයක් සතු සනාථන සභාවක් පැවතිය යුතු අතර, එකී සනාථන සභාවේ සංයුතිය පනතෙහි 46(2) වගන්තිය පරිදි විය යුතු වේ. පනතෙහි 46(5) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයක ඉගැන්වීම්, අධ්‍යයන කටයුතු, පර්යේෂණ සහ විභාග පැවැත්වීම සනාථන සභාවේ මඟ පෙන්විම සහ පාලනය යටතේ සිදුවිය යුතු ය.

සනාථන සභාවේ බලතල කාර්යය සහ කර්තව්‍යයන්

පනතෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට සහ පනතෙහි 46 (5) වගන්තිය මඟින් පවරා දී ඇති බලතල වල ස්වභාවයට අගතියක් නො වන පරිදි, සනාථන සභාව විසින් පනතෙහි 46(6) වගන්තියට අනුව තම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

**මණ්ඩප සභාවේ වගකීම්**

5.7.3 1995 අංක 01 දරන මණ්ඩප සභා නියමාවලිය මගින් දක්වා ඇති පරිදි සෑම මණ්ඩපයක්ම මණ්ඩප සභාවකින් සමන්විත වන අතර, පනතේ 47(2) වගන්තිය ප්‍රකාරව, මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනය, එහි යහ පැවැත්ම උදෙසා වූ කරුණු පිළියෙල කිරීම සහ මණ්ඩපයට අනුයුක්ත අයවලුන් හට අදාල පහසුකම් සැපයීම යන කරුණු සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත.

**පීඨ සභාවක බලතල, කාර්යය සහ කර්තව්‍යයන්**

5.7.4 විශ්වවිද්‍යාලයක සෑම පීඨයක් සඳහා ම පීඨ සභාවක් තිබිය යුතු අතර, එහි සාමාජිකත්වය පනතෙහි 48 (1A) වගන්තිය හා අදාල සංශෝධන මගින් දක්වා තිබේ. එකී පීඨ සභාවන්හි බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම පනතෙහි 48(3) වගන්තිය හා අදාල සංශෝධන වලට අනුව සිදු කළ යුතු වේ.

**උපාධි අධ්‍යායන පීඨය සහ එහි උපාධි අධ්‍යාපන පීඨ මණ්ඩලයේ වගකීම්**

5.7.5 පනතහි 48 A වගන්තියට අනුව පිහිටුවන ලද උපාධි අධ්‍යායන පීඨයන් 2020 අංක 05 දරන උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය මගින් දක්වා ඇති අයවලුන්ගෙන් සමන්විත පීඨ මණ්ඩලයක් තිබිය යුතු වේ.

පනතෙහි සහ වෙනත් උචිත සාධන පත්‍රයක සහ සනාථන සභාවේ උපදෙස් වලට අනුකූලව, අධ්‍යයන කටයුතු පර්යේෂණ, විභාග, පීඨ/ප්‍රජා සම්බන්ධතා සහ දැනුම බෙදා හැරීම පිළිබඳ කටයුතු උපාධි අධ්‍යයන පීඨයේ සිදුකරනු ඇත. එමෙන් ම ඉහත සඳහන් නියමාවලිය මගින් පවරා දී ඇති කරුණු වලට අගතියක් නොවන පරිදි හා මෙහි සඳහන් පරිදි, පීඨ සභාව විසින් තම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කළ හැකි වේ.

**විශ්වවිද්‍යාල විද්‍යායතනයක කළමනාකරණ මණ්ඩලය සතු බලතල, කාර්යය සහ කර්තව්‍යයන්**

5.7.6 පනතෙහි 63 (1) වගන්තිය සහ එහි සංශෝධනයන්හි සඳහන් කොට ඇති සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විශ්වවිද්‍යාල විද්‍යායතනයක කළමනාකරණ මණ්ඩලය, විශ්වවිද්‍යාලයක පාලක සභාව හා සමාන වේ. එකී කළමනාකරණ මණ්ඩලය පනතෙහි විධි විධානයන්ට යටත්ව, 63 (3) වගන්තියෙන් දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලයක පාලක සභාවට පනතෙහි 45 වන වගන්තිය මගින් නියම කරනු ලැබූ බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

**ශාස්ත්‍රීය කමිටුවක් (Academic Syndicate) සතු බලතල, කාර්යය සහ කර්තව්‍යයන්**

5.7.7 පනතෙහි 64 (1) වගන්තිය සහ අදාල සංශෝධනයන්හි සඳහන් සමාජිකත්වයක් සහිත ශාස්ත්‍රීය කමිටුව පනතෙහි 46 වන වගන්තියේ සඳහන් විශ්වවිද්‍යාලයක සනාථන සභාව වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්යය සහ කර්තව්‍යයන් එකී පනතෙහි 64(4) වගන්තියෙන් දක්වා ඇති පරිදි ක්‍රියාත්මක කිරම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

5.7.8 ආයතනයක හෝ උසස් අධ්‍යාපනය සඳහා වූ මධ්‍යස්ථානයක, කළමනාකරණ මණ්ඩලය, එහි ශාස්ත්‍රීය සහ විධායක කමිටුව වන්නේ ය. පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයක සඳහන් විධිවිධානයන්ට යටත්ව, එකී ආයතනය හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවීමට අදාල නියමාවලිය මඟින් පවරා ඇති සහ නියමකොට ඇති පරිදි තම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සිදු කළ යුතු ය.

*ආයතනයක ශාස්ත්‍රීය සහ විධායක කමිටුව*

5.8 කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි ස්ථාවර සහ අනෙකුත් යථායෝගී කමිටු

5.8.1 කොමිෂන් සභාව

(අ) කොමිෂන් සභාව විසින්, පනතෙහි 4 (2) වගන්තිය මඟින් අදාල බලතල, කාර්යය සහ කර්තව්‍යයන් සහිතව සහ නිශ්චය කරනු ලබන සාමාජික සංඛ්‍යාවකින් යුතුව ස්ථාවර කමිටු සහ යථායෝගී කමිටු, කලින් කලට පත්කළ හැකි ය. එසේ පත් කරන ලද කමිටුවක සභාපතිත්වය, කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් දැරිය යුතු වේ.

*ස්ථාවර සහ යථායෝගී කමිටු*

(ආ) පනතෙහි 15 (vii) වගන්තියට අනුව, සිසුන් ඇතුලත්කර ගැනීමේ කමිටුව විමසීමෙන් අනතුරුව, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයන් වෙත ඇතුලත් කිරීම සඳහා සිසුන් තෝරා ගැනීමේ බලය කොමිෂන් සභාව සතු වේ. සිසුන් ඇතුලත් කිරීමේ කමිටුවක සංයුතිය, බලතල, කාර්යය සහ කර්තව්‍යයන් සිසුන් ඇතුලත් කිරීමේ නියමාවලි අංක. 1979/05 හි දක්වා ඇත.

*සිසුන් ඇතුලත්කර ගැනීමේ කමිටුව*

(ඇ) පනතෙහි 78 වන වගන්තියට අනුව, ආචාර්යවරයකු නොවන තනතුරක් දරන්නා වූ ඕනෑම තැනැත්තෙකු උසස් අධ්‍යාපන ආයතනයන් හෝ උසස් අධ්‍යාපන ආයතනයක සිට කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාවේ සිට උසස් අධ්‍යාපන ආයතනයන් වෙත හෝ ස්ථාන මාරු කිරීම කල හැකි ය. මෙම ස්ථාන මාරු කිරීම්, මාරු කිරීමේ මණ්ඩලයේ නිර්දේශයකට අනුව කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර, මාරු කිරීම් මණ්ඩලයේ සංයුතිය අදාල රීති මඟින් නිශ්චය කරනු ඇත.

*මාරුකිරීම් මණ්ඩලය*

(ඈ) මුදල් අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි සහ මහපෙන්වීම් වලට අනුකූලව, විගණන කමිටුව, ප්‍රසම්පාදන කමිටුව, ජොෂ්ඨ

*වෙනත් කමිටු*

කළමනාකරණ කමිටුව ආදී කමිටු කොමිෂන් සභාව විසින් පත්කළ හැකි ය. මෙකී කමිටුවල සංයුතිය, බලතල, කාර්යය සහ කර්තව්‍යයන් අදාල රෙගුලාසි සහ මහපෙන්වීම්වල දක්වා ඇති ආකාරයට ම විය යුතු ය.

5.8.2 උසස් අධ්‍යාපන ආයතන

උසස් අධ්‍යාපන ආයතනයක ස්ථාවර හෝ යථායෝගී කමිටු

පාලක සභාවට, සනාථන සභාවට සහ පීඨ සභාවලට හා වෙනත් බල මණ්ඩලයන් සඳහා අවශ්‍ය අනුශාසනය, සම්බන්ධීකරණය සහ සහායවීම උදෙසා පනත මඟින් ලබා දී ඇති බලතල මෙන්ම මහා භාණ්ඩාගාරය සහ කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කර ඇති විධානවලට අනුව ද, උසස් අධ්‍යාපන ආයතනයක් විසින් ස්ථාවර හෝ යථායෝගී කමිටු පිහිටුවිය හැකි ය.

පනතෙහි දක්වා ඇති පරිදි කමිටු පත්කළ යුතු බව

(අ) පනතෙහි 45 (2) (xiv) වගන්තියට අනුව, පාලක සභාව විසින් පත්කරන ලද සුභසාධක මණ්ඩලයක් තිබිය යුතු වේ. පනතෙහි 46(6) (vii) වගන්තිය අනුව සනාථන සභාව විසින් පහත සඳහන් ස්ථාවර හෝ යථායෝගී කමිටු හෝ වෙනත් මණ්ඩල පිහිටුවිය හැකි ය.

- පුස්තකාල කමිටුව
- පර්යේෂණ කමිටුව
- විෂයමාලා සහ ඇගයීමේ කමිටුව
- අධ්‍යයන නිවාඩු කමිටුව (නිවාඩු සහ ප්‍රදාන කමිටුව)
- ඇතුලත්කර ගැනීමේ කමිටුව

පාලක සභාව මඟින් පත්කරනු ලබන වෙනත් කමිටු

(ආ) තම අභිමතය පරිදි හෝ කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන විධානයන්ට අනුව, පාලක සභාව විසින් පහත සඳහන් කමිටු පිහිටුවිය හැකිය.

- මුදල් කමිටුව
- ඉඩම් හා ගොඩනැගිලි පාලන කිරීමේ කමිටුව
- අභ්‍යන්තර තත්ත්ව පාලන කළමනාකරණ කමිටුව
- උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කමිටුව
- ක්‍රීඩා උපදේශක මණ්ඩලය
- ශිෂ්‍යාධාර සහ ශිෂ්‍ය සුභසාධක කමිටුව
- නේවාසිකාගාර කමිටුව (නිවාස කමිටුව)
- අදාල යැයි හැඟෙන වෙනත් කමිටු

(ඇ)

- මහා භාණ්ඩාගාර/පොදු ව්‍යාපාර චක්‍රලේඛ සහ මහපෙන්වීම් පාදක කරගනිමින්, කොමිෂන් සභාව විසින් නිකුත් කරන

විධානවලට අනුව පහත සඳහන් කමිටු ද ස්ථාපනය කල හැකි ය.

- විගණන කමිටු
- ප්‍රසම්පාදන කමිටු (Major/Minor)
- කළමනාකරණ කමිටු (උපකුලපතිතුමාගේ උපදේශක කමිටුව)
- වෙනත් කමිටු

5.8.3 කරුණු එසේ වුව ද, ඒ ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් මෙම කමිටු/ මණ්ඩල සතු බලතල, කාර්යය සහ කර්තව්‍යයන් සහ ඒවායේ සංයුතිය පනතෙහි ප්‍රතිපාදන වලට අනුකූලව සහ කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි බලතල, කාර්යය සහ කර්තව්‍යයන්ට යටත්ව, රීති මඟින් පැහැදිලිව දක්වා තිබිය යුතු ය. — කමිටුවල කාර්යය ලැයිස්තුව

5.9 කොමිෂන් සභාවේ සභාපති, විශ්වවිද්‍යාලයක කුලපති, උසස් අධ්‍යාපන ආයතනයන්හි නිලධාරීන් සහ ඔවුන්ගේ වගකීම්

5.9.1 කොමිෂන් සභාවේ සභාපති; — කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ වගකීම්

(අ) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ගණන්දීමේ නිලධාරයා ද වන්නේ ය.

(ආ) ඔහු කොමිෂන් සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු පාලනය කළයුතු අතර, කොමිෂන් සභාවේ සියළුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු වේ.

(ඇ) පනතෙහි 15,16 සහ 18 යන වගන්තීන් හැර, එකී පනත මඟින් කොමිෂන් සභාවට පවරා ඇති, නියමකොට ඇති සහ බලාත්මක කොට ඇති යම් බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ඉටුකිරීමේ බලය සභාපතිවරයාට පවරා දී තිබේ.

(ඈ) පනත මඟින් තමන්ට නියමකොට, බලාත්මක කොට හෝ පවරා දී ඇති පරිදි කොමිෂන් සභාවේ විශේෂිත හෝ සාමාන්‍ය මඟපෙන්වීමට යටත්ව බලතල, කාර්යය සහ කර්තව්‍යයන් බලාත්මක කිරීමට, ක්‍රියාත්මක කිරීමට හෝ මුදා හැරීමට

5.9.2 කුලපතිවරයා විශ්වවිද්‍යාලයක ප්‍රධානියා වන්නේය. පැමිණ සිටින විටක දී, කුලපතිවරයා විශ්වවිද්‍යාලයක උපාධි ප්‍රදානෝත්සවයක මුලසුන දරයි. — කුලපතිවරයාගේ වගකීම්

5.9.3 පනතෙහි 33 සිට 39 දක්වා වූ වගන්තිවලින් විශ්වවිද්‍යාලයක "නිලධාරීන්" නිර්වචනය කොට තිබේ. ඔවුන් නම්; උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මණ්ඩපයක් වෙතොත් එහි මණ්ඩපාධිපති, පීඨයන්හි පීඨාධිපතිවරු, ලේඛකාධිකාරී, පුස්තකාලයාධිපති, — විශ්වවිද්‍යාලයක නිලධාරීන්

මූලාධිකාරී සහ නියමාවලියක් මඟින් "නිලධාරියකු" යැයි ප්‍රකාශිත තනතුරක් දරන්නකු

උපකුලපතිවරයාගේ වගකීම්

(1) විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා

(අ) විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන නිලධාරියකු වන්නේ ය.

(ආ) ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියා ද වන්නේ ය.

(ඇ) නිල බලයෙන් පාලක සභාවේ සහ සනාථන සභාවේ සභාපතිවරයා වන්නේ ය.

(ඈ) විශ්වවිද්‍යාලයේ වෙනත් බල මණ්ඩලයන් හෝ අධිකාරියන් රැස්කිරීමට, පෙනීසිටීමට සහ කතා කිරීමට හිමිකම් ඇති මුත්, එවැනි බල මණ්ඩලයක හෝ අධිකාරියක සාමාජිකයකු නොවන කල්හි එකී රැස්වීම් වලදී තම ඡන්දය භාවිතා කිරීමට අවසර නොමැත්තේ ය.

(ඉ) පනතෙහි සහ වෙනත් උචිත සාධන පත්‍රයක දක්වා ඇති ප්‍රතිපාදනයන් යටතේ, විධි වූ පරිද්දෙන් පාලක සභාව විසින් කලින් කලට නිකුත් කරන විධානයන්, නිසි පරිදි පිළිපැදීමට. එකී කරුණු ඉටුකිරීම වෙනුවෙන් තමන්ට අවශ්‍ය යැයි හැඟෙන සියළුම බලතල ක්‍රියාත්මක කිරීමේ හැකියාව ද ඇත්තේ ය.

(ඊ) පාලක සභාව හෝ සනාථන සභාව විසින් ගනු ලැබූ තීරණ බලාත්මක කිරීම සහ පිළිපැදීමට වගකීමෙන් බැඳී සිටී.

(උ) විශ්වවිද්‍යාලයක ගණන්දීමේ නිලධාරියා වන්නේ ය.

(ඌ) පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය විෂයයෙහි අනුමත කරනු ලැබූ ප්‍රතිපත්ති සහ පියවර ක්‍රියාත්මක කිරීමට සහ පරිපාලනයට අවශ්‍ය ප්‍රතිපත්තීන්, මඟපෙන්වීම් සහ සුපරීක්ෂණය කිරීමට සහ විශ්වවිද්‍යාලය තුල විනය ආරක්ෂා කිරීමට ද වගකිව යුතු ය.

නියෝජ්‍ය උපකුලපතිවරයාගේ වගකීම්

(2) නියෝජ්‍ය උපකුලපතිවරයකු;

(අ) විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන නිලධාරියකු වන්නේ ය.

(ආ) 1995 අංක 4 දරණ නියෝජ්‍ය උපකුලපති නියමාවලියට අනුව, ශිෂ්‍යයින් සම්බන්ධ කටයුතුවල වගකීම දරන්නේ ය.

(ඈ) උපකුලපති තනතුර හිස් වූ අවස්ථාවක දී හෝ උපකුලපතිවරයා හට තාවකාලිකව තම තනතුරේ රාජකාරී කටයුතුවල යෙදීමට නොහැකිවන අවස්ථාවක දී, උපකුලපති තනතුරේ රාජකාරී ඉටුකිරීමේ වගකීම පැවරී තිබේ.

(3) මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයකු; — මණ්ඩපාධිපතිවරයාගේ වගකීම්

(අ) මණ්ඩපයේ පූර්ණ කාලීන නිලධරයකු වන්නේ ය.

(ආ) මණ්ඩපයේ ප්‍රධාන පරිපාලන සහ අධ්‍යයන නිලධාරියා වන්නේ ය.

(ඇ) මණ්ඩප සභාවේ මුලසුන දරයි.

(ඈ) මණ්ඩපයේ වෙනත් බල මණ්ඩලයන් හෝ අධිකාරියන් රැස්කිරීමට, එහි පෙනී සිටීමට හෝ කතා කිරීමට හිමිකම් ඇති අතර, එවැනි බල මණ්ඩලයක හෝ අධිකාරියක තමන් සාමාජිකයකු නොවන කල්හි එකී රැස්වීම්වල දී තම ඡන්දය පාවිච්චි කිරීමට අවසර නොමැත්තේ ය.

(ඉ) මණ්ඩපය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇත.

(4) විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා; — ලේඛකාධිකාරීවරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනතේ හෝ වෙනත් උචිත සාධන පත්‍රයන් මඟින් පවරනු ලැබූ, බලාත්මක කරනු ලැබූ හෝ ආදේශ කරනු ලැබූ බලතල කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ නියම කිරීමේ වගකීම දරයි.

(ආ) විශ්වවිද්‍යාලයේ දේපල සහ ලේඛන භාරව කටයුතු කිරීමේ වගකීම දරයි.

(ඇ) නිල බලයෙන් පාලක සභාවේ සහ සනාථන සභාවේ ලේකම්වරයා වන්නේ ය.

(ඈ) විශ්වවිද්‍යාලයේ සහකාර ගණන්දීමේ නිලධාරියා වේ.

(ඉ) උපකුලපතිවරයාගේ මඟපෙන්වීම සහ පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු මෙහෙයවීම සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ විනය පාලනය කිරීමේ වගකීම දරයි.

(5) විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරීවරයා; — මූල්‍යාධිකාරීවරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනතේ හෝ

වෙනත් උචිත සාධන පත්‍රයන් මඟින් පවරනු ලැබූ, බලාත්මක කරනු ලැබූ හෝ ආදේශ කරනු ලැබූ බලතල කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ නියම කිරීම

(ආ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සහ ලේඛකාධිකාරීවරයාගේ මහපෙන්වීම සහ පාලනයට යටත්ව, අදාල රීති මඟින් දක්වා ඇති පරිදි එහි ගිණුම් පවත්වාගෙන යාම. තව ද, විශ්වවිද්‍යාලයේ අරමුදල් මූල්‍යාධිකාරීවරයා භාරයේ පවතී.

(6) විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා — පුස්තකාලයාධිපතිවරයාගේ වගකීම්

(අ) පුස්තකාලයාධිපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනත මඟින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් නියම කොට, බලාත්මක කොට හෝ පවරාදී ඇති බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ ඉෂ්ඨ කිරීම ද කළ යුතු ය.

(ආ) උපකුලපතිවරයාගේ මෙහෙයවීම සහ පාලනයට යටත්ව පුස්තකාල පරිපාලනය කිරීම හෝ විශ්වවිද්‍යාලයක පුස්තකාලයේ වගකීම දරයි

(7) පීඨයක පීඨාධිපතිවරයා; — පීඨාධිපතිවරයාගේ වගකීම්

(උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ද ඇතුළුව )

(අ) විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන නිලධාරියකු වන්නේ ය.

(ආ) පීඨයේ අධ්‍යයන සහ පරිපාලන ප්‍රධානියා වන්නේ ය.

5.9.4 පනතෙහි 56 සිට 61 වන වගන්තිය දක්වා, විශ්වවිද්‍යාල විද්‍යායතනයක නිලධාරීන් නිර්වචනය කොට ඇත. ඔවුන් නම්; — විශ්වවිද්‍යාල විද්‍යායතනයක නිලධාරීන්

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා,

එක් එක් පීඨයන්හි පීඨාධිපතිවරු, විද්‍යායතනයේ ලේකම්වරයා පුස්තකාලයාධිපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයා වේ.

(1) විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා; — අධ්‍යක්ෂවරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පූර්ණකාලීන නිලධාරියකු වන්නේ ය.

(ආ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද වන්නේ ය.

(ඇ) නිල බලයෙන් කළමනාකරණ

මණ්ඩලයේ සහ ශාස්ත්‍රීය කමිටුවේ සභාපතීත්වය දරන අතර, එකී බල මණ්ඩලවල රැස්වීම් කැඳවීම ද කළ යුතු ය.

(ඈ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ගණන්දීමේ නිලධාරියා වේ.

(ඉ) විශ්වවිද්‍යාල විද්‍යායතනය තුල විනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

(ඊ) විද්‍යායතනයේ වෙනත් කුමන හෝ බල මණ්ඩලයක හෝ සභාවක දී පැමිණ සිටීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය තිබෙන අතර, එකී බල මණ්ඩලයන්හි හෝ සභාවෙහි සාමාජිකයකු නො වන කල්හි, එකී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියක් නොමැත.

(උ) පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයන්, ප්‍රතිපාදනයන් යථා පරිදි පිළිපැදීමට වගකිව යුතු අතර, විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය මඟින් දෙන ලද පනතෙහි හෝ වෙනත් උචිත සාධන පත්‍රයන්හි අඩංගු ප්‍රතිපාදනයන් වරින් වර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීත්‍යානුකූල විධානයන් ඉටුකිරීමේ වගකීම දැරිය යුතු අතර, එකී විධානයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලතල සතුව සිටී.

(ඌ) කළමනාකරණ මණ්ඩලය හෝ ශාස්ත්‍රීය කමිටුව මඟින් ගන්නා ලද තීරණයන් හට අවශ්‍ය වලංගුභාවය ලබා දීමට හෝ එකී තීරණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

(2) විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයකු;

විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනත මඟින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් නියම කොට ඇති, පවරා දී ඇති හෝ බලාත්මක කොට ඇති බලතල කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ ඉෂ්ට කිරීම ද කළ යුතු ය.

(ආ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ දේපල සහ ලේඛනවල භාරකාරීත්වයේ වගකීම දරයි.

(ඇ) කළමනාකරණ මණ්ඩලය සහ ශාස්ත්‍රීය කමිටුව යන දෙකෙහිම ලේකම්වරයා වේ.

(ඈ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සහකාර ගණන්දීමේ නිලධාරියා වේ.

(ඉ) අධ්‍යක්ෂවරයාගේ මගපෙන්වීම සහ මෙහෙයවීම යටතේ, විද්‍යායතනයේ එදිනෙදා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් සහ එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය පිළිබඳව ද වගකීම දරනු ලබයි.

(3) විශ්වවිද්‍යාල විද්‍යායතනයක පුස්තකාලයාධිපතිවරයා;

විශ්වවිද්‍යාල විද්‍යායතනයක පුස්තකාලයාධිපතිවරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනත මඟින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් නියම කොට ඇති, පවරා දී ඇති හෝ බලාත්මක කොට ඇති බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ ඉෂ්ඨ කිරීම ද කළ යුතු ය.

(ආ) අධ්‍යක්ෂවරයාගේ මගපෙන්වීම සහ මෙහෙයවීමට යටත් ව විශ්වවිද්‍යාල විද්‍යායතනයක පුස්තකාලය හෝ පුස්තකාලයන්හි පරිපාලනය පිළිබඳ වගකීම දැරිය යුතු ය.

(4) විශ්වවිද්‍යාල විද්‍යායතනයක භාණ්ඩාගාරිකවරයකු;

විශ්වවිද්‍යාල විද්‍යායතනයක භාණ්ඩාගාරිකවරයාගේ වගකීම්

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර, පනත මඟින් හෝ වෙනත් උචිත සාධන පත්‍රයක් මඟින් නියම කොට ඇති, පවරා දී ඇති හෝ බලාත්මක කොට ඇති බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, පිළිපැදීම සහ ඉෂ්ඨ කිරීම ද කළ යුතු ය.

(ආ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මුදල් පාලනය පිළිබඳ වගකීම දරන අතර, ලේකම්වරයාගේ මගපෙන්වීම සහ මෙහෙයවීම් යටතේ, අදාල රීති මඟින් නියම කොට ඇති ආකාරයට විද්‍යායතනයේ ගිණුම් පවත්වාගෙන යා යුතු ය. විද්‍යායතනයේ අරමුදල් භාණ්ඩාගාරිකවරයා භාරයේ පවතී.

(5) විද්‍යායතනයේ පීඨයක පීඨාධිපතිවරයකු;

විශ්වවිද්‍යාල විද්‍යායතනයක පීඨාධිපතිවරයාගේ වගකීම්

- (අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පූර්ණ කාලීන නිලධාරියකු වන්නේ ය.
- (ආ) පීඨයේ පරිපාලනය සහ අධ්‍යයන ප්‍රධානියා ද වන්නේ ය.

5.9.5 උසස් අධ්‍යයන ආයතන හෝ උසස් අධ්‍යයන මධ්‍යස්ථානයන්හි "නිලධාරීන්", ඒ ඒ ආයතන පිහිටුවීමට අදාල නියමාවලිය මඟින් නිශ්චය කොට ඇත. පොදුවේ ගත්කල, එකී ආයතනයන්හි අධ්‍යක්ෂවරයා, එහි "නිලධාරියකු" ලෙස දක්වා තිබේ.

උසස් අධ්‍යාපන ආයතනයක/ මධ්‍යස්ථානයක නිලධාරීන්

(1) අධ්‍යක්ෂවරයා;

අධ්‍යක්ෂවරයාගේ වගකීම්

- (අ) උසස් අධ්‍යායන ආයතනයක/ මධ්‍යස්ථානයක පූර්ණ කාලීන නිලධාරියකු වන්නේ ය.
- (ආ) උසස් අධ්‍යයන ආයතනයකට/ උසස් අධ්‍යයන මධ්‍යස්ථානයකට අදාල නියමාවලියට අනුව, එහි ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද, ප්‍රධාන පරිපාලන නිලධාරියා ද වන්නේ ය.
- (ඇ) එකී ආයතනයන්ට අදාල නියමාවලියන්හි සඳහන් පරිදි, අධ්‍යක්ෂවරයා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සභාපතිවරයා වන අතර, ආයතනයේ/ මධ්‍යස්ථානයේ අනෙකුත් බල මණ්ඩලයන්හි නිල බලයෙන් පත් වූ සාමාජිකත්වය ද දරනු ලබයි.
- (ඈ) එක් එක් ආයතනයට අදාල නියමාවලියේ සඳහන් පරිදි, ආයතනයේ/ මධ්‍යස්ථානයේ යම් බල මණ්ඩලයන් හෝ වෙනත් සමුච්ඡයන් රැස්කිරීමට, පැමිණ සිටීමට සහ අදහස් දැක්වීමට බලය ඇති මුත්, එවැනි බල මණ්ඩලයක හෝ සමුච්ඡයක සාමාජිකයකු නොවූ කල්හි එහි ඡන්දය පාවිච්චි කළ නො හැකි ය.
- (ඉ) ආයතනයේ/ මධ්‍යස්ථානයේ ගණන්දීමේ නිලධාරියා වේ.
- (ඊ) ආයතනය/ මධ්‍යස්ථානය තුල විනය පවත්වා ගැනීමේ වගකීම දැරිය යුතු ය.
- (උ) කළමනාකරණ මණ්ඩලය මඟින් හෝ, ආයතනය/ මධ්‍යස්ථානය අනුබද්ධ විශ්වවිද්‍යාලයේ පාලක සභාව මඟින් හෝ අදාල නියමාවලිය මඟින් නියම කොට ඇති වෙනත් බල මණ්ඩලයන් මඟින් හෝ පනතෙහි සහ

වෙනත් උචිත සාධන පත්‍රයක, ආයතනය/ මධ්‍යස්ථානය කෙරෙහි බලපාන පරිදි දක්වා ඇති සහ වරින් වර නිකුත් කරන්නා වූ නීත්‍යානුකූල විධානයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියළුම බලතල යථා පරිදි පරිහරණය කිරීමට.

(ඌ) කළමනාකරණ මණ්ඩලය මඟින්, පාලක සභාව මඟින් හෝ ආයතනයට/ මධ්‍යස්ථානයට අදාල නියමාවලිය මඟින් නියමකොට ඇති වෙනත් බල අධිකාරියන් මඟින් හෝ දෙනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට වගකීමෙන් බැඳී සිටියි.

5.10 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

5.10.1 පනත මඟින් එහි 80 සහ 81 වන වන වගන්ති ප්‍රකාරව, අමාත්‍යවරයා හට සභාපතිවරයකු, උපසභාපතිවරයකු සහ තවත් එක් සමාජිකයකුගෙන් සමන්විත විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයක් පත් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දී ඇත්තේ ය.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සංයුතිය

5.10.2 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට පහත සඳහන් බලතල, කාර්යය සහ කර්තව්‍යයන් පැවරී ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය ද පැවරී ඇත.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍යයන්

(අ) බඳවා ගැනීමේ පරිපාටියේ උසස්වීම් සහ පත්කිරීමේ ක්‍රමවේදයන් අඩංගු විධිවිධාන උල්ලංඝනය කරමින්, කොමිෂන් සභාව විසින්, උසස් අධ්‍යාපන ආයතනයන් විසින් සිදුකරන ලද හෝ සිදු කරන ලදැයි චෝදනා කරන ලද හෝ පත්කිරීම් සහ උසස් කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන පැවැත්වීමට.

(ආ) විනය කරුණු සම්බන්ධයෙන් දෙනු ලැබූ දඬුවම්වලට එරෙහිව කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු අයෙකු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමට.

(ඇ) ඉහත කරුණු වලට අදාලව තමන් විසින් ගනු ලැබූ තීරණ, කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියාට දැනුම් දීමට.

(ඈ) තම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් නිසි පරිදි ඉටුකිරීමට, නියම කිරීම සහ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළුම කරුණු ආවරණය වන පරිදි නියමාවලි සෑදීමට

5.10.3 ඉහත උපඡේද 5.10.2 හි සඳහන් කොට ඇති පරිදි, තම බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට, නියම කිරීමට හෝ බලාත්මක කිරීමට, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වන අතර, එවැනි තීරණ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවකදී වුව ද, කොමිෂන් සභාව , උසස් අධ්‍යාපන ආයතනය එම තීරණ ක්‍රියාත්මක කළ යුතු වේ.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ තීරණ අවසාන සහ ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති බව

6. අනෙකුත් පොදු ප්‍රතිපාදනයන්

6.1 කොමිෂන් සභාවේ විශේෂිත බල මණ්ඩලයක, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය සහ සෑම උසස් අධ්‍යාපන ආයතනයකම කාර්ය මණ්ඩලය සාමාජිකයින් පනතෙහි 122 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ කථනයන් තුල හා හේතු කාරණා තුල රජයේ සේවකයින් ලෙස සලකනු ලැබේ.

දණ්ඩ නීති සංග්‍රහය අදාල වන බව

6.2 පනතෙහි 123 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව, අනෙකුත් බල මණ්ඩල, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය සහ සෑම උසස් අධ්‍යාපන ආයතනයන්ම අල්ලස් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව "නම් කරන ලද ආයතනයක්" ලෙස අරුත් ගන්වා තිබේ.

අල්ලස් පනත

6.3 මෙම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනයන්ට අදාල ආයතන සංග්‍රහයේ කිසියම් කරුණක් අරබයා ප්‍රතිපාදන සලසා දී නොමැති අවස්ථාවක දී, රජයේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනයන් අදාල පරිදි ආදේශ කළ හැකි ය.

රජයේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ආදේශ කිරීම

6.4 මෙම සංශෝධිත ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන, එකී සංග්‍රහය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කොට පිළිගනු ලැබූ 2023 සැප්තැම්බර් මස 07 වන දින සිට කොමිෂන් සභාවට සහ සියළු උසස් අධ්‍යාපන ආයතනයන් විෂයයෙහි බලාත්මක වේ.

දැනට භාවිතයේ පවත්නා ආයතන සංග්‍රහය, එහි ප්‍රතිපාදනයන්ට අනුරූපව මේතාක් ගන්නා ලද තීරණයන්ට හා අනතුරුව නිකුත් කරන්නා වූ චක්‍රලේඛ උපදෙස් වලට අගතියක් නොවන පරිදි අහෝසි කොට, මෙම සංශෝධිත ආයතන සංග්‍රහය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ.

ආයතන සංග්‍රහය ක්‍රියාත්මක වන දිනය

6.5 විශ්වවිද්‍යාල පද්ධතියේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙම ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සම්බන්ධයෙන් මනාලෙස දැනුවත් වීම අත්‍යවශ්‍ය කරුණකි.